සැ. යු. - 2013.02.08 වැනි දින පළවූ අංක 1797 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,798 - 2013 පෙබරවාරි මස 15 වැනි සිකුරාදා - 2013.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 186 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 186 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 188 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 195 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 මාර්තු මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 පෙබරවාරි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මහාධිකරණය - යාපනය**

රාජසන්තක කරන ලද ට්‍රැක්ටර් රථය (Tractor) ප්‍රසිද්ධ වෙන්දේසිය මගින් විකිණීම

චාවකච්චේරි මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද ට්‍රැක්ටර් රථයක් විකිණීම සම්බන්ධව ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ. මෙයට අදාළ ටෙන්ඩර් පත්‍රය යාපනය මහාධිකරණයේ ගිණුම් අංශයෙහි රුපියල් 100 ක මුදලක් ගෙවා කාර්යාල වේලාවෙහි ලබාගත හැකි ය.

ට්‍රැක්ටර් රථය චාවකච්චේරි මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර ඇතිව කාර්යාල වේලාවෙහි බැලීමට හැකිය. වාහනය සම්බන්ධව විස්තර පහත සඳහන් වේ.

| *වාහන විස්තර* | *ආපසු ගෙවීමට අදාළ තැන්පත්* රු. | *ආපසු නොගෙවීමට අදාළ තැන්පත්* රු. |
|---|---|---|
| 1. Tractor (Massey Ferguso Model) | 5,000 | 100 |

ටෙන්ඩර් පත්‍රය මහාධිකරණ කොමසාරිස්, මහාධිකරණය, යාපනය යන ලිපිනයට සීල් තබා අලවා 2013.03.08 දිනට පෙර ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතු ය. ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි "ට්‍රැක්ටර් රථය මිළ දී ගැනීමට අදාළ ටෙන්ඩර් පත්‍රය - 2013" යනුවෙන් සඳහන් විය යුතු ය.

ජේ. විශ්වනාදන්,
සභාපති/මහාධිකරණ කොමසාරිස්.

ටෙන්ඩර් මණ්ඩලය,
මහාධිකරණය,
යාපනය.

02-583

---

# බඩු බාහිරාදිය විකිණීම්

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මුතූර්**

උසාවියට ඉදිරිපත් කරන ලද රත්තරන් භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

රාජසන්තක කර ඇති හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2013.02.27 වැනි දින ප.ව. 02.00 මුතූර් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. මෙහි පහත සඳහන් වන කිසියම් ද්‍රව්‍යයන් පිළිබඳ හිමිකම් දක්වන්නෙකු නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

2. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකි ය.

3. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

4. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

5. ජාතික හැඳුනුම්පත රැගෙන භාණ්ඩ ඉල්ලීමට පැමිණ සිටිය යුතු බව විශේෂයෙන් දැනුම් දෙමි.

දිසා විනිසුරු,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
මුතූර්.

නඩු අංකය :AR 367/2011

**රත්තරන් භාණ්ඩ විස්තර**

| *අනු. අංකය* | *රත්තරන් භාණ්ඩ විස්තර* | *බර* | *කැරට් විස්තර* | *ඇස්තමේන්තුව* |
|---|---|---|---|---|
| 01. | වළලු | 5.7g | 20 | 30,600.00 |
| 02. | වළලු | 5.7g | 20 | 30,600.00 |
| 03. | වළලු | 7.89g | 20 | 42,400.00 |
| 04. | මාලය | 15.78g | 18 | 73,000.00 |
| 05. | කරාබු | 3.2g | 18 | 9,000.00 |
| 06. | පෙන්ඩන් | 0.84g | 18 | 3,750.00 |

02-548

## මහෙස්ත්‍රාත් අධිකරණය - ගල්ගමුව

### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ රාජසන්තක කරන ලද භාණ්ඩ හා මෙතෙක් හිමිකම්පාන්නන් ඉදිරිපත් නොවූ භාණ්ඩ වෙන්දේසි කිරීම

01. ගල්ගමුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ 2013.03.02 වැනි දින පෙ. ව. 9.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන භාණ්ඩ පිළිබඳ හිමිකම් දක්වන්නෙකු සිටී නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසි ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළිනොගන්නා අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියේ විකිණීමෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේදීම මුදල් ගෙවිය යුතු අතර පස්වරු 5.00 ට පෙර අදාළ භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. එසේ ම සියලුම ගෙවීම් මුදලින් පමණක් සිදු කළ යුතු අතර, චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිල දී ගනු ලබන අය තම ජාතික හැඳුනුම්පත හෝ අනන්‍යතාවය තහවුරු කළ හැකි වෙනත් හැඳුනුම්පතක් හෝ ඉදිරිපත් කළ යුතු ය.

යූ. බී. කුලතුංග,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
ගල්ගමුව.

2013 ජනවාරි මස 23 වැනි දින,
ගල්ගමුව මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| 01. | 84145 | චැසි අංක එල්. එච්. එස්. පී. සී. එෆ්. එල්. ඒ. 032000419 හා එන්ජින් අංක එච්. එස්. 147 එෆ්. එම්. එෆ්. ඒ. 03012165 දරන හොන්සන් යතුරුපැදිය |
| 02. | 85701 | අංක ජී. ඩබ්. 2385 දරන බොක්සර් යතුරුපැදිය |
| 03. | 86042 | අංක 117-1100 දරන යමහා මේට් යතුරුපැදිය |
| 04. | 86258 | චැසි අංක සී. එෆ්. 50 ඉසෙඩ්. 360608 හා එන්ජින් අංක එස්. ටී. 50 ඊ 6319768 දරන හොණ්ඩා චැලි යතුරු පැදිය |
| 05. | 86443 | අංක 155-2776 දරන සී ඩී 50 හොණ්ඩා යතුරු පැදිය |
| 06. | 87015 | අංක 109 -4256 දරන යතුරු පැදිය |
| 07. | 87750 | අංක වී. එච්. 4427 දරන බජාජ් ඩිස්කවරි යතුරු පැදිය |
| 08. | 89439 | අංක ජී. කියු - 3616 දරන හොණ්ඩා සී ඩී 50 යතුරු පැදිය |
| 09. | 90019 | අංක 151-1053 දරන යතුරුපැදිය |
| 10. | 90249 | චැසි අංක එල්. ඒ. පී. පී. සී. කේ. එල්. එස්. 93 එල්. 000002 හා එන්ජින් අංක 15157 එෆ්. එම්. අයි. 0012200375 දරන යතුරුපැදිය |
| 11. | 92745 | අංක යූ. එල්. 2982 දරන බජාජ් පැටිනා යතුරුපැදිය |
| 12. | ඒ. ආර්. 02/11 | එන්ජින් අංක වයි. එක්ස්. 150 එෆ්. එම්. ජී. 02424791 දරන ඩයිඩෝ වර්ගයේ යතුරු පැදිය |
| 13. | 87250 | එන්ජින් අංක 1500 දරන සිපෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය, ටේලරය |
| 14. | 89521 | ලියාපදිංචි අංක 77-3030 දරන සිපැන් වර්ගයේ අත්ට්‍රැක්ටරය, ටේලරය |
| 15. | 88849 | චැසි අංක 10173 හා එන්ජින් අංක 27 14 දරන සීපෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය, ටේලරය |
| 16. | 89911 | චැසි අංක යූ. එම්. 0112 සහ එන්ජින් අංක යූ, එම්. 10128 දරන සීපෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය, ටේලරය |
| 17. | 89877 | අංක රහිත සීපෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය, ටේලරය |
| 18. | 93832 | අංක රහිත සීපෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය, ටේලරය |
| 19. | 94112 | අංක රහිත සීපෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය, ටේලරය |
| 20. | 82912 | ලියාපදිංචි අංක එස්. ජී. 2829 දරන ඇග්‍රෝටෙක් වර්ගයේ අත්ට්‍රැක්ටරය, ටේලරය |
| 21. | 91582 | චැසි අංක 5762 දරන සීපෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය |
| 22. | 92931 | චැසි අංක ඊ. ඩී. 650841 දරන සහ එන්ජින් අංක 40881 දරන එඩ්ග්‍රෝ අත්ට්‍රැක්ටරය, ටේලරය |
| 23. | 92542 | චැසි අංක 5886 දරන සීපෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය, ටේලරය |
| 24. | 82801 | ලියාපදිංචි අංක 78-6233 සහ චැසි අංක ආර්. 020061 දරන ෆාම් මාස්ටර් වර්ගයේ අත්ට්‍රැක්ටරය, ටේලරය |
| 25. | 93439 | අංක රහිත සීපෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය, ටේලරය |
| 26. | 93505 | චැසි අංක 6308 හා එන්ජින් අංක 1446 දරන සිපෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය, ටේලරය |
| 27. | 42568 | අංකය අපැහැදිලි ලුමාලා වර්ගයේ පා පැදියක් |
| 28. | 62202 | අංකය 1836861 දරන ලැගේජය සහිත පා පැදිය |
| 29. | 82117 | අංක පී. එච්. 24732 දරන රෝමා වර්ගයේ පා පැදිය |
| 30. | 64848 | අංක 51664211 දරන රතුපාට ලුමාලා පා පැදිය |
| 31. | 67656 | අංක 358422 දරන මවුන්ටන් වර්ගයේ පා පැදිය |
| 32. | 85212 | අංක 2207760 දරන ලුමාලා වර්ගයේ පා පැදිය |
| 33. | ඒ. ආර්. 599/09 | අංක 24033139 දරන වර්ගය නොදන්නා පා පැදිය |
| 34. | ඒ. ආර්. 278/11 | අංක 55938016 දරන ලුමාලා වර්ගයේ පා පැදිය |
| 35. | 96561 | අඩි 15 1/2 ක් දිග ෆයිබර් ඔරුව |
| 36. | 96562 | අඩි 15 1/2ක් දිග ෆයිබර් ඔරුව |
| 37. | 96563 | අඩි 15 1/2ක් දිග ෆයිබර් ඔරුව |
| 38. | 96564 | අඩි 15 1/2ක් දිග ෆයිබර් ඔරුව |
| 39. | 96565 | අඩි 15 1/2ක් දිග ෆයිබර් ඔරුව |
| 40. | 82892 | කලු සහ රතුපාට ෆ්ලැෂර් වර්ගයේ විදුලි පන්දම |
| 41. | 85671 | එල්. ජී. 5200 එල් දරන යාන්ත්‍රික ඉරුම් කියත ලී මිට සහිත කුඩා පොරව |
| 42. | 87564 | අංක 00182 දරන එම්. එම්. 250 වර්ගයේ වඩු මැෂිම |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| 43. | 90890 | කොම්පසර් ග්‍රයින්ඩර් සහිත අඩි 13 අඟල් 06ක් දිග හෝස් බට එකයි<br>හැමර් එකයි<br>මිටි එකයි<br>උදළු එකයි |
| 44. | 58842 | උදළු එකයි |
| 45. | 73359 | කුලුගෙඩි 04යි |
| 46. | 76813 | පොරෝ එකයි |
| 47. | 79273 | සවල් එකයි |
| 48. | 79274 | පොරෝ එකයි |
| 49. | 79275 | සවල් එකයි |
| 50. | 80300 | පොරෝ එකයි |
| 51. | 80610 | කුළු ගෙඩි එකයි |
| 52. | 86766 | මන්නා කැති එකයි |
| 53. | 81258 | කැති එකයි |
| 54. | 81763 | යකඩ ඉනි එකයි |
| 55. | 86444 | සවල් දෙකයි |
| 56. | 87508 | මුළුමට්ටම් 01යි<br>පොරව එකයි<br>යකඩ ඉනි එකයි |
| 57. | 88847 | කැති 01යි |
| 58. | 88848 | කැති එකයි |
| 59. | 85463 | යකඩ කියත් එකයි |
| 60. | 85761 | පොරෝ එකයි |
| 61. | 82369 | වක්පිහි එකයි |
| 62. | 87591 | කැති එකයි |
| 63. | 83010 | යකඩ ඉනි එකයි |
| 64. | 83466 | කැති එකයි |
| 65. | 83897 | කැති එකයි |
| 66. | 89384 | සවල් 06යි<br>උදළු එකයි |
| 67. | 89749 | ඇලුමිනියම් කලගෙඩි 01යි |
| 68. | 89791 | යකඩ ඉනි එකයි<br>කුළුගෙඩි එකයි |
| 69. | 89792 | යකඩ ඉනි එකයි<br>කුළුගෙඩි එකයි |
| 70. | 91906 | සවල් එකයි |
| 71. | 93744 | කොළකැති එකයි |
| 72. | 93745 | කොළ කැති එකයි |
| 73. | 94506 | යකඩ බාල්දි දෙකයි<br>සවල් එකයි |
| 74. | 94507 | ලී මිට සහිත උදළු එකයි<br>යකඩ බාල්දි එකයි<br>සවල් එකයි |
| 75. | 94591 | සවල් එකයි<br>උදළු එකයි |
| 76. | 94735 | උදළු එකයි<br>තහඩු බාල්දි එකයි |
| 77. | 95961 | ඉලෙක්ට්‍රෝනික තරා එකයි |
| 78. | 95962 | ඉලෙක්ට්‍රෝනික තරාදි එකයි |
| 79. | ඒ. ආර්. 524/12 | නොකියා ජංගම දුරකථන එකයි |
| 80. | ඒ. ආර්. 525/12 | ජංගම දුරකථන එකයි |

භාණ්ඩ සමීක්ෂණය මගින් වෙන්දේසිය සඳහා නියම කරන ලද මේස, යතුරු ලියන මේස, පුටු කැලි, කොටස්

භාණ්ඩ සමීක්ෂණය මගින් වෙන්දේසිය සඳහා නියම කරන ලද වානේ කැබිනට් දෙකක්

හිස් බෝතල් තොගයක්

හිස් බූලි තොගයක්

හිස් බැරල් තොගයක්.

02-476

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. ඩබ්ලිව්. එම්. ආර්. එස්. එන්. කේ. උඩුරාවන මහත්මිය විසින් 2012ක් වූ මාර්තු මස 24 වැනි දින ලියා සහතික කරන ලද, අංක 128 දරන විශේෂ ඇටර්නි බලපත්‍රයේ මහරගම, මහවත්ත පටුමග, නල්ලවත්ත පාරේ, අංක 11/14ඒ හි පදිංචි ජා. හැ. ප. අංක 770250250 V හිමි ඉන්දික සුරංග මුණසිංහ විසින් ඇටර්නි බලකරු වන දික්වැල්ල, ඌරුගමුව, නාවරහේන, මැදහේන දරන ස්ථානයේ පදිංචි ජා. හැ. ප. අංක 681010823 V හිමි රාජසිංහ හෙට්ටිආරච්චි විල්සන් වික්‍රමරත්න යන අය වෙත දෙනු ලැබූ ඇටර්නි බලය අවලංගු හා බලරහිත කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් දැනුම් දෙන අතර, ඉහත කී බලකරු විසින් කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් මා වගකීම් නොදරන බව ද දැනුම් දෙමි.

ඉන්දික සුරංග මුණසිංහ.

2013ක් වූ ජනවාරි මස 28 වැනි දින.

02-385

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 242 (3) (බී) වගන්තිය යටතේ ය.

2007 අංක 7 දරන සමාගම් පනතේ 242 (1) වගන්තියෙහි ප්‍රතිපාදනවලට අනුව සීමාසහිත ෆුඩ්ස් ටෙක්නොලොජීස් (පුද්ගලික) සමාගම සීමාසහිත නොර්ෆෝක් ෆුඩ්ස් (පුද්ගලික) සමාගම සමග ඒකාබද්ධ කිරීම.

සීමාසහිත ෆුඩ්ස් ටෙක්නොලොජීස් (පුද්ගලික) සමාගම සහ සීමාසහිත නොර්ෆෝක් ෆුඩ්ස් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් එම එක් එක් සමාගම්වල අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2013 ජනවාරි 9 දින සම්මත කළ ලිඛිත යෝජනා සම්මතයන් මගින් 2007 අංක 7 දරන සමාගම් පනතේ 242 (1) වගන්තියට අනුකූලව එම සමාගම් දෙක ඒකාබද්ධ කෙරෙන බවට ද සීමාසහිත නොර්ෆෝක් ෆුඩ්ස් (පුද්ගලික) සමාගම ඒකාබද්ධ සමාගම ලෙසට පවතිනු ඇති බවට ද තීරණය කර ඇත.

මෙම ඒකාබද්ධ කිරීම 2013 පෙබරවාරි මස 28 වැනි දින සිට හෝ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වරයා විසින් තීරණය කරනු ඇති වෙනත් යම් දිනයක සිට බලපැවැත්වෙනු ඇත. ඒකාබද්ධිත සමාගමේ ලියාපදිංචි ලිපිනය හෝමාගම, කටුවාන කර්මාන්ත පුරයේ අංක 142 හි පිහිටි සීමාසහිත නොර්ෆෝක් ෆුඩ්ස් (පුද්ගලික) සමාගමේ වර්තමාන ලියාපදිංචි ලිපිනය වනු ඇත.

ඒකාබද්ධිත සමාගමේ අධ්‍යක්ෂකවරුන් වනුයේ සීමාසහිත නොර්ෆෝක් ෆුඩ්ස් (පුද්ගලික) සමාගමේ වර්තමාන අධ්‍යක්ෂවරුන්ය.

සී. ඒ. එස්. කෝපරේට් සර්විසස් (පුද්.) සමාගම,
ලේකම්වරු.

02-521

---

## සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : සිල්ක් රෝඩ් අයිලන්ඩ් රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 90174
සංස්ථාගත කිරීමේ දිනය : 2012 දෙසැම්බර් 26
ලියාපදිංචි කාර්යාලය : අංක 38 ඒ, ඉහළගම, ගම්පහ.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

02-594/1

---

## සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

පහත සඳහන් සමාගමේ නම 2013 ජනවාරි මස 08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තියට අනුගාමීව සහ (8 වැනි වගන්තියට අනුගාමීව) මෙයින් ප්‍රසිද්ධ නිවේදනය කරනු ලැබේ.

සමාගමේ කලින් තිබූ නම : රෙවින් ඇඩ්වර්ටයිසිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 63196
සමාගමේ ලිපිනය : අංක 52, කිරුළපන ඇවනියු, කොළඹ 05
සමාගමේ නව නාමය : කැන්ලාර්ක් ඉවෙන්ට්ස් ඇන්ඩ් ඇඩ්වර්ටයිසිං (ප්‍රයිවට්) ලිමිටඩ්.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

02-594/2

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සණස කෝපරේට් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2013ක් වූ ජනවාරි මස 07 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : සණස කෝපරේට් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 90411
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 1 බී, කැප්පෙටිපොළ පාර, කොළඹ - 05.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව,

කෝ- සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

02-595

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ෆාර් බිස්නස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 90412
සංස්ථාගත කළ දිනය : 2013.01.07
ලිපිනය : අංක 3/3, පළමු පටුමග, (මෙල්ෆර්ට් වත්ත) ගැමුණුපුර, කොතලාවල, කඩුවෙල.

සමාගම් ලේකම්.

02-596

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මණ්ඩාවල ඉහළ ලුණුගම පදිංචිව සිට දැනට සියඹලාපේ, සියඹලාපේ උතුර අංක 404 හි පදිංචි කාරියප්පෙරුම අතුකෝරලලාගේ දෝන නන්දාවතී කාරියප්පෙරුම වන මා විසින් කඩවත ඉහළ බියන්විල කොස්ලන්දවත්තේ අංක 603/6 ඩී හි පදිංචි නිලාන්ත විජේරත්න යන අයට ප්‍රසිද්ධ නොතාරිස් ඊ. ඒ. හේමචන්ද්‍ර යන අය විසින් අංක 8667 දරන ඇටෝර්නි බලපත්‍රය සහ ඉහත සඳහන් සියඹලාපේ ලිපිනයේ ම පදිංචි ජයසූරිය ආරච්චිගේ ඩිල්කා හර්ෂනී ජයසූරිය යන අප විසින් ප්‍රසිද්ධ නොතාරිස් ඊ. ඒ. හේමචන්ද්‍ර යන අය විසින් ලියන ලද ඇටෝර්නි බලපත්‍ර බල රහිතකර අවලංගු කරන අතර මින් ඉදිරියට ඔහු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට, බලයකට, ඔප්පුවකට ඔහු වෙනුවෙන් අප වග නොකියන බව උතුම් වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාවටත් මෙයින් දන්වා සිටිමු.

02-601

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ පහත සමාගම ලියාපදිංචි කර ඇත :-

සමාගමේ නම : විලා @ ද නිලාවේලි බීච් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම ලියාපදිංචි කළ දිනය : 2013.01.09
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 90467
ලිපිනය : අංක 7, විල්සන් වීදිය, කොළඹ 12.

අධ්‍යක්ෂවරුන්ගේ අණ පරිදි.

02-584/1

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ පහත සමාගම ලියාපදිංචි කර ඇත :-

සමාගමේ නම : වෙල්සි ඉම්පෝට් ඇන්ඩ් එක්ස්පෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම ලියාපදිංචි කළ දිනය : 2007.08.10
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 60980
ලිපිනය : අංක 77/18 සී, මොරගහ පටුමග, බෝධිය පාර, මිරිහාන, නුගේගොඩ.

අධ්‍යක්ෂවරුන්ගේ අණ පරිදි.

02-584/2

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලුම දෙනා වෙත දන්වා සිටින වග මෙසේ ය :

ඇහැළියගොඩ, විපුලසේන මාවත තිලක් කඩේ අංක 242 ඒ දරන ස්ථානයෙහි පදිංචි අංක 686932010 වී දරන ජාතික හැඳුනුම්පත හිමි අලුතපත්පේඩි හේවාදුරගේ ශ්‍රියාලතා වන මම මා විසින් ඇහැළියගොඩ, විපුලසේන මාවත, තිලක් කඩේ අංක 242 ඒ දරන ස්ථානයෙහි පදිංචි අංක 886381018 V දරන ජාතික හැඳුනුම්පත හිමි මුදුන්කොටුව ආරච්චිගේ චතුරිකා සඳමාලි යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරමින් කැළණිය ගෝනවල පාර පදිංචි සුජානි ජයවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් මහත්මිය විසින් 2007.08.29 වැනි දින ලියා සහතික කරන ලද අංක 275 දරන ඇටෝර්නි බලපත්‍රය මත එකී මාගේ ඇටෝර්නි බලකරු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක්, පෙනී සිටීමක්, ගනුදෙනුවක් සම්බන්ධයෙන් මා වග නොකියන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02-576

---

### දැන්වීමයි

පහත සඳහන් සමාගම ස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ :

සමාගම : ඉන්ක්ලූසිව් මීඩියා මොනිටරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලිපිනය : අංක 100, නොරිස් කැනල් පාර, කොළඹ 10
සංස්ථාගත කළ දිනය : 2011.08.25
ලියාපදිංචි කළ අංකය : පී වී 80903.

02-563

---

### දැන්වීමයි

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 07 දරන ඡේදය අනුව මහජනයා වෙත කරන නිවේදනයයි.

සමාගමේ නම : විජය ඩිජිටල් මීඩියා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 90682 දිනය : 2013.01.24
ලියාපදිංචි ලිපිනය : අංක 08, හුණුපිටිය හරස් පාර, කොළඹ 02.

සමාගම් ලේකම්.

විජය ඩිජිටල් මීඩියා (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 08, හුණුපිටිය හරස් පාර,
කොළඹ 02.

02-565

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : රන්ටා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 90159
ලියාපදිංචි කාර්යාලය : අංක 212/14, 1 වැනි පටුමග, කළපලුවාව, රාජගිරිය
සංස්ථාගත කළ දිනය : 2012 දෙසැම්බර් 24
අධ්‍යක්ෂකවරු : 1. දජහෙට්ටිගේ මුහන්දිරම්ගේ චින්තක ක්‍රිස්ටෝපර් රොෂාන් පීරිස්,
2. ඩොනල්ඩ් සිල්වෙස්ටර් ෆීලික්ස්
3. ලංකා රංගනාත් වික්‍රමසිංහ.

02-566

---

### නිවේදනයයි

පහත සඳහන් සමාගම සංස්ථාපන කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරමු :-

සමාගමේ නම : බ්‍රිටිෂ් වෝටර් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 89826
ලියාපදිංචි කාර්යාලය : අංක 45/ජී, ශාන්ත ජෝසප් පටුමග, කොළඹ 04
සංස්ථාගත කිරීමේ දිනය : 2012 දෙසැම්බර් මස 11

බී. එන්. එම්. සී. ආර්. ඩබ්. ගුණවර්ධන මිය.
සමාගම් ලේකම්වරු.

"විලා වික්ටෝරියා"
උස්වැටකෙයියාව.

02-567

## 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

සමාගමේ නම : ඉන්ටර් ලංකා සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ලියාපදිංචි අංකය : පී වී 80748

ලියාපදිංචි කළ දිනය : 2011 අගෝස්තු 18

ලියාපදිංචි ලිපිනය : අංක 20/2, ග්‍රීන්ලන්ඩ් ඇවනියු, දෙහිවල.

සමාගම් ලේකම්.

02-571

---

## මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව සෙනරත් යාපා ඉන්වෙස්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2013 ජනවාරි මස 04 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : සෙනරත් යාපා ඉන්වෙස්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 90358
ලියාපදිංචි ලිපිනය : අංක 531, කිරිබ්බන්වැව, සෙවනගල (වම).

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. ඒ. කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 071-8 244 495/ 077 8 197 041.

02-469

---

## මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව දිරිය එක්සත් ලංකා (ගැරන්ටි) ලිමිටඩ් ඇපයෙන් සීමිත සමාගමක් ලෙස 2013 ජනවාරි මස 15 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : දිරිය එක්සත් ලංකා (ගැරන්ටි) ලිමිටඩ්
සමාගම් අංකය : ජී එල් 2 223
ලියාපදිංචි ලිපිනය : අංක 88 ඒ, ග්‍රාමෝදය මාවත, මහවැව.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. ඒ. කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 071 8 244 495/ 077 8 197 041.

02-470

---

## මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව හැල්සියෝන් හොලිඩේස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2012 දෙසැම්බර් මස 31 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : හැල්සියෝන් හොලිඩේස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 90245
ලියාපදිංචි ලිපිනය : අංක 273, 2 වැනි මහල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. ඒ. කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 071 8 244 495/ 077 8 197 041.

02-471

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

එක්සත් රාජධානියේ එච්ඒ 3 -9පී. ටී., හැරෝ, ශාන්ත පෝල් ඇවනිව්, අංක 197 ඒ දරන ස්ථානයේ පදිංචි තේජා කුමාරි ලංකා කැප්පෙටිපොල වන මම නීතිඥ නසීම් එම්. මන්සූර් මහතා විසින් සහතික කරන ලද වර්ෂ 2012.03.31 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර ඇති බව ද, මින්පසු එකී ඇටෝර්නි බලපත්‍රය යටතේ සමන්ත ලංකා කැප්පෙටිපොල යන අය විසින් කරනු ලබන කිසිම කටයුත්තකට මා විසින් වග නොකියන බව ද මහජනතාවගේ දැන ගැනීම පිණිස ප්‍රකාශ කර සිටිමි.

තේජා කුමාරි ලංකා කැප්පෙටිපොල.

2013 ජනවාරි මස 29 වැනි දින.

02-467

---

## වගකීම සීමාසහිත සමාගමක් සඳහා ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරුණු ලබන දැන්වීමයි

සමාගම් නම : ඊස්ටර්න් ඉනිටර්නැෂනල් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි දිනය : 2013.01.24
සමාගම් අංකය : පී. වී. 90676
ලියාපදිංචි කාර්යාලය : 309, 309 ඒ ප්‍රධාන පාර, කින්නියා.

සමාගම් ලේකම්.

02-464

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : වැවලියද්ද ටිම්බර් ලෑන්ඩ් ප්‍රයිවට් ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 65953
සංස්ථාගත කළ දිනය : 2008 ඔක්තෝබර් 23
ලියාපදිංචි ලිපිනය : අංක 301, හයිලෙවල් පාර, මහරගම.

නීතිඥ අතුල වලිසුන්දර,
සමාගම් ලේකම්.

02-474

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : පිග් ලෑන් ප්‍රයිවට් ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 80061
සංස්ථාගත කළ දිනය : 2011 ජූනි 27
ලියාපදිංචි ලිපිනය : අංක 380/3, ගනහේන, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල.

සෙනවිරත්න රන්හොටි ගමගේ ජගත්,
සමාගම් අධ්‍යක්ෂ.

02-473

### සමාගම් නාමය වෙනස් කිරීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නාමය 2012 මාර්තු මස 26 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වෙනස් කර ඇති බව මෙයින් දන්වා සිටිමු.

සමාගමේ පැරණි නාමය : සොෆ්ට්ලොජික් ක්‍රෙඩිට් ලිමිටඩ් (Softlogic Credit Limited)
සමාගමේ අංකය : පී බී 589 (PB 589)
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 1, ලේක් ක්‍රෙසන්ට්, කොළඹ 02
සමාගමේ නව නාමය : ලාෆ්ස් කැපිටල් ලිමිටඩ් (LAUGFS CAPITAL LIMITED)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

නීතිඥ කීර්ති පතිරාජ,
සමාගම් ලේකම්.

02-499

### නිවේදනයයි

මැක්ස්වෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, (පෙර මැක්ස්වෙල් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්

**සමාගමේ ලියාපදිංචි අංකය පී වී 5772**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තියට අනුකූලව පහත සඳහන් නම මෙසේ වෙනස් කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 8 වැනි වගන්තියේ විධිවිධානවලට අනුකූලව 2013 ජනවාරි මස 22 වැනි දින සිට මැක්ස්වෙල් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෙර නාමය) එහි නාමය මැක්ස්වෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (නව නාමය) යනුවෙන් වෙනස් කොට ඇති බවත්, එනමුත් සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය තවදුරටත් අංක 150, ශාන්ත ජෝශප් වීදිය, කොළඹ 14 බවත් මෙයින් අප මහජනතාවට දැනුම් දෙමු.

සමාගමේ ලේකම්.

මැක්ස්වෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 150, ශාන්ත ජෝශප් වීදිය,
කොළඹ 14.

02-355

### පීක් ස්පෝර්ට්ස්වෙයාර් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම සම්බන්ධ ප්‍රසිද්ධ දැන්වීමයි

පීක් ස්පෝර්ට්ස්වෙයාර් (ප්‍රයිවට්) ලිමිටඩ් වර්ෂ 2013ක් වූ ජනවාරි මස 18 වැනි දින සීමිත පෞද්ගලික සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමු.

සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 90601
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : මෙල්ෆර්ට් එස්ටේට්, ගැමුණුපුර, කොතලාවල, කඩුවෙල.

ඩයනි සී. මිල්ලවිතානාච්චි,
සමාගම් ලේකම්.

02-353

### නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්ති ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ග්‍රීන් ඕවල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 88811
ලියාපදිංචි කාර්යාලය : අංක 283, විජය පාර, මාබෝලෙ, වත්තල
සංස්ථාපිත දිනය : 2012 ඔක්තෝබර් 12.

ජේ. ජී. විමලරත්න,
සමාගමේ ලේකම්.

02-392

### නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : එෆ්ජීඑම් රිටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 89319
ලියාපදිංචි කාර්යාලය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සංස්ථාපිත දිනය : 2012.11.12.

සමාගම් ලේකම්වරු,
කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

02-389/1

---

### නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : එෆ්ජීඑම් ජෙනරල් ට්‍රේඩිං ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 89321
ලියාපදිංචි කාර්යාලය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07

සමාගම් ලේකම්වරු,
කෝපරේට් ඇඩ්වයිසර් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

02-389/2

---

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : කේ එන් ආර් ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 90067
ලියාපදිංචි කාර්යාලය : අංක 108, "කුසුම්", රඹුක්කන පාර, ගලගෙදර
ලියාපදිංචි දිනය : 2012 දෙසැම්බර් 20.

සමාගමේ ලේකම්වරු.

02-386

---

### ඇටෝනි බලපත්‍රය අවලංගු කිරීම

මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දැනුම්දෙන ලද්දේ වර්ෂ 2008.09.22 දිනැති අංක 848 දරන පුෂ්පා ආර්. කන්නන්ගර ප්‍රසිද්ධ නොතාරිස්තැන ඉදිරිපිට දී අළුබෝමුල්ල මහබෙල්ලන අංක 39/9 දරන තැන පදිංචි ජා. හැ. ප. අංක 798543156 V හිමි කළුතන්ත්‍රිගේ යුරේෂනී ඉන්දිකා පෙරේරා නමැති අයගේ නමින් බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ අළුබෝමුල්ල මහබෙල්ලන, අංක 39/9 දරන තැන පදිංචි ජා. හැ. ප. අංක 773452083 V හිමි පැල්පොලගේ දොන් සුමිත් ගුණතිලක වන මා විසින් ලබා දී ඇති ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2013.01.28 වැනි දින සිට අවලංගු කර අහෝසි කරන ලද බවය. මෙදින සිට එකී ඇටෝර්නි බලකරු විසින් ඉහත සඳහන් ඇටෝනි බලපත්‍රය යටතේ කරනු ලබන කිසියම් ක්‍රියාවලට සහ පියවරවලට මා වග කියනු නොලැබේ.

පී. ඩී. ඇස්. ගුණතිලක.

2013 ජනවාරි මස 28 වැනි දින.

02-376

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියට අනුගාමීව පහත සඳහන් ආයතනය සීමිත වගකීම් සහිත සමාගමක් ලෙස සංස්ථාපනය කර ඇති බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සින්ඩිකේට් මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවෙට් ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 19774
සංස්ථාගත කිරීමේ දිනය : 1989.11.16
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 127, පළමුවැනි මහල, පීපල්ස් පාක් සංකීර්ණය, පිටකොටුව, කොළඹ 11

සමාගම් අධ්‍යක්ෂ.

02-361

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගාල්ලේ වටරැක ලැන්දැව පාර අංක 82 හි පදිංචි සමන්ත සංජීව වේවැල්වල හේවගේ වන මා විසින් වර්ෂ 2003.01.12 වැනි දින ගාල්ලේ ප්‍රධාන නොතාරිස් චන්ද්‍රන එස්. පී. ගොඩකන්දගේ මහතා විසින් ලියා සහතික කරන ලද අංක 38 දරන රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඌව සබරගමුව පළාත් කාර්යාලයේ ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ දෙවැන කාණ්ඩයේ 142 පත්ඉරුවේ දින පොත් අංක 41 යටතේ ලියාපදිංචි කර තිබූ ඇටෝර්නි බලපත්‍රය මත උඩුකුඹුර, නෙළුම්දෙනිය පදිංචි කාරියවසම් බෝවිතන්ත්‍රිගේ උපුල් හරිස්චන්ද්‍ර කාරියවසම් වෙත පවරා තිබූ විශේෂ ඇටෝර්නි බලය වර්ෂ 2013 ජනවාරි මස 23 වැනි දින සිට අවලංගු කරන ලද බව සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

02-360

---

### මෙත්සර (ගරන්ටි) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම සම්බන්ධ ප්‍රසිද්ධ දැන්වීමයි

මෙත්සර (ගරන්ටි) ලිමිටඩ් වර්ෂ 2013ක් වූ ජනවාරි මස 17 වැනි දින ඇපයෙන් සීමිත සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

සමාගමේ ලියාපදිංචි අංකය : පී. එල්. 2229
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : මැණික්කඩවර, තුන්තොට.

ඩයනි සී. මිල්ලවිතානාච්චි,
සමාගම් ලේකම්.

02-352

---

### රන් මලු පැෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය PV 2258

2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ හවුල් ඇවරකරුවන්ගේ පත්වීමේ දැන්වීම

සමාගමේ නම : රන් මලු පැෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 03, බුලර්ස් පටුමග, කොළඹ 07
උසාවිය : බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්)
නඩු අංකය : HC (CIVIL) 50/2011/CO
හවුල් ඇවරකරුවන්ගේ නම් : පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ් හවුල් ඇවරකරුවෝ
ලිපිනය : SJMS ඇසෝසියේට්ස් බාරේ ප්‍රතිව්‍යුහගත කිරීම හා ආයතනික අයකර ගැනීම්
4 වැනි මහල, අංක 02, කාසල් පටුමග
කොළඹ 04
පත්වීමේ දිනය : 2013 ජනවාරි 18.

02-453/1

---

### රන් මලු පැෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය පීවී 2258

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ පරිවෘත කිරීමේ නියෝගය

සමාගමේ නම : රන් මලු පැෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 03, බුලර්ස් පටුමග, කොළඹ 07
උසාවිය : බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්)
නඩු අංකය : HC (CIVIL) 50/2011/CO
නියෝගය දුන් දිනය : 2013 ජනවාරි 18
පෙත්සම ඉදිරිපත් කළ දිනය : 2011 ඔක්තෝබර් 25
හවුල් ඇවරකරුවන්ගේ නම් : පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ් හවුල් ඇවරකරුවෝ
ලිපිනය : SJMS ඇසෝසියේට්ස් බාරේ ප්‍රතිව්‍යුහගත කිරීම හා ආයතනික අයකර ගැනීම්
4 වැනි මහල, අංක 02, කාසල් පටුමග,
කොළඹ 04.

02-453/2

---

### නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ෆ්ලෝරා ඇග්රි එක්ස්පො (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 90109
ලියාපදිංචි කාර්යාලය : අංක 63/1, වෝඩ් පෙදෙස, කොළඹ 07
සංස්ථාපිත දිනය : 2013.01.08.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.

02-450

---

### ප්‍රසිද්ධ නිවේදනයයි

යූරො ඒෂියන් ඒජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2013 ජනවාරි මස 18 වැනි දින 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර සංස්ථාපනය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : යූරො ඒෂියන් ඒජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : 90590
ලියාපදිංචි කාර්යාලය : අංක 5, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07.

සහාය කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 23 ඒ 1/1, සුලෛයිමන් ඇවනියු,
කොළඹ 5.

02-424

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) යටතේ නිවේදනය

සමාගමේ නම : ඒ. එන්. අයි. එන්ටර්ප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2008.04.09
සමාගමේ අංකය : අංක පී වී 63787
ලියාපදිංචි ලිපිනය : අංක 145/17 A, බෝගහවත්ත පාර, හේකිත්ත, වත්තල.

02-422

---

### දැන්වීමයි

පහත විස්තර කරන ලද (ව්‍යාපාර නම හා අංක දරන) සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : මැන්ටා ට්‍රස්ට් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සංස්ථාගත කළ දිනය : 2013.01.11
3. සමාගමේ අංකය : පී වී 90500
4. ලියාපදිංචි ලිපිනය : ඒවයියු නිවස 3-2, 9/4, රුහුණුකලා මාවත, කොළඹ 08.

එකවුන්ටිං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

අංක 67 ඒ, ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.
02-423

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) යටතේ නිවේදනය

**ග්‍රීන් වැලී'ස් ෂෙල්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

2013.01.09 වැනි දින අංක පී වී 90466 යටතේ සංස්ථාගත කරන ලදී.
ලියාපදිංචි ලිපිනය : අංක 165 1/A, කෙයිසර් වීදිය, කොළඹ 11.

02-421

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර චත්‍ර හවුස් ඔෆ් ඇඩ්වර්ටයිසින් (පීවීටී) එල්ටීඩී 2012 ජූලි 18 වැනි දින සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : චත්‍ර හවුස් ඔෆ් ඇඩ්වර්ටයිසින් (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පීවී 87112
ලියාපදිංචි කාර්යාලය : අංක 15, ෆයිෆ් පාර, කොළඹ 05.

ලේකම්.

02-427

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - අම්බලන්තොට ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර විසින් 2000 පෙබරවාරි මස 10 වැනි දින සාදන ලද පිඹුරු අංක 2365 හි දැක්වෙන දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුවාපත්තුවේ වදුරුප්ප පිහිටි ඇලගාවවත්ත ලන්ද සහ අරගාවවත්ත නම් ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් බී දරන පර්චස් තිහක් (අ. 0 රූ. 0 පර්. 30)

විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ වගාවන් සහ එහි පවත්නා සියලු දේත් සමග වේ.

මහදුර සුදුසිංහ අජිත් ප්‍රියන්ත කුමාර ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කරන ලද දේපළ වර්ෂ 2013ක් වූ මාර්තු මස 08 වැනි දින ප. ව. 2.00 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2011.02.11 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2013.02.15 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2013.02.18 දින ලක්බිම, සහ ද අයිලන්ඩ් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.*- වදුරප්ප පාර ආරම්භයේ ඇති තංගල්ල - හම්බන්තොට ප්‍රධාන පාරේ ඔරලෝසු කණුව ඉදිරියෙන් ඇති අම්බලන්තොට නගරයේ මීටර 200ක් පමණ ගිය පසු තෙරපුත්ත මහා විද්‍යාලය ළඟින් දකුණට හැරුණු පසු වලවේ ගඟ වෙත යා හැකි අඩි 16 පාර හමු වේ. එම පාරේ මීටර් 40ක් පමණ ගිය විට දකුණට ඇති අඩි 12 පාරක් ද හමු වේ. එම පාරේ වම් අත පැත්තේ තල්ලුකරන ගේට්ටුවක් (Sliding Gate) දමා ඇති 2 වැනි ඉඩම වේ.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු යః-

01. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%),
02. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. නොතාරිස් ගාස්තුව රු. 2,000,
05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
07. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ අම්බලන්තොට ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 129, තිස්ස පාර,
අම්බලන්තොට,
දුරකථන අංකය : 047-2223819
ෆැක්ස් අංකය : 047-2223817.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෝෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 182, 3 වැනි මහල,
උසාවි පාර, කොළඹ 12,
දුරකථන/ෆැක්ස් අංකය : 011-2445393
ඊමේල් : senaservice@sltnet.lk

02-489

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය

සෙලාන් බැන්ක් ලිමිටඩ්, අංක 69, ජනාධිපති මාවත, කොළඹ 01, දැන් සෙලින්කෝ සෙලාන් ටවර්ස්, අංක 90, ගාලු පාර, කොළඹ 03.

නඩු අංකය : මහාධි සිවිල් 254/2005(1)

......................පැමිණිලිකරු.

-එදිරිව-

1. මදූ ඕවර්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
   අංක 03, මහා විද්‍යාල මාවත, කොළඹ 13

2. සැමුවෙල් ඇල්බට්,
   අංක 103, මහා විද්‍යාල මාවත, කොළඹ 13.

........................විත්තිකරුවෝ.

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමේ නියෝගය අනුව ඉහත නම් සඳහන් 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන් ගෙන් අයකරගන්නා ලෙස පැමිණිලිකරුට නියම කරන ලද 2009ක් වූ පෙබරවාරි මස 02 වැනි දින ඇතුළත් කර ඇති තීන්දු ප්‍රකාශය අනුව රුපියල් එක්කෝටි පනස්හතර ලක්ෂ හතළිස් එක් දහස් හයසිය තිස් දෙකයි ශත හැත්තෑ එකක (රු. 1,54,41,632.71) මුදලක් සහ ඒ මත 2005.08.26 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දින තෙක් වර්ෂයකට 32% බැගින් වැඩිදුරටත් වන පොළිය ද, ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සමස්ත මුදල මත සම්පූර්ණයෙන් ගෙවා නිම වනතෙක් නෛතික පොළිය අයකරගැනීමට පැමිණිලිකරුට ආඥාකොට ඇත. තව ද, පැමිණිල්ලේ උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම හා ස්ථානය ද, ඊට අයත් මාර්ග ප්‍රවේශය සහ විත්තිකරුවන්ට අයත් සියලුම අයිතිවාසිකම්, හිමිකම්, සම්බන්ධකම් හා කවර අන්දමේ ඉල්ලීම් ද සහිතව හා සියලුම කුලී, ලාභ හෝ අනිකුත් ආදායම් හා එකී ඉඩම සහ ස්ථානය නිසා ඇතිවන සියලුම ලැබීම් හා විත්තිකරුවන්ට හිමි සියලුම අයිතිවාසිකම් ද ඉහත කී මුදල් අයකර ගැනීම සඳහා යටත් හා ඇස්කීසි කළ හැකි බවට නියෝග කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇත. තවද, මෙහි පහත උපලේඛනයේ සහ තීන්දු ප්‍රකාශයේ උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම අයකර ගත යුතු සම්පූර්ණ මුදල අයකර ගැනීම සඳහා බැඳී ඇති බවටත් එය ඇස්කීසි කළ හැකි බවටත් වැඩිදුරටත් නියෝග කොට තීන්දු ප්‍රකාශ කොට ඇත.

ඉහත කී මුදල් අයකිරීම සඳහා පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ 2009.12.04 වැනි දින පෙ. ව. 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා නියම කර එකී කටයුතු කරගෙන යාමේ දී විත්තිකරුවන් පැමිණිලිකරු සමග යම්කිසි එකඟත්වයකට පැමිණ එක්වර රුපියල් 15,400,000 ක මුදලක් පැමිණිලිකරු වෙත ගෙවන ලද හෙයින් එකී සමථය අනුව පැමිණිලිකරුගේ උපදෙස් පිට එකී ප්‍රසිද්ධ වෙන්දේසිය ම විසින් නවතාලන ලදී. නමුත් ඉන්පසුව උක්ත සමථය අනුව විත්තිකරුවන්ගේ ඉදිරි කටයුතු ඉටු නොකරන ලද හෙයින් නැවත වතාවක් මෙම දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා කටයුතු කරන ලෙසට මට පැමිණිලිකරු උපදෙස් ලබා දෙන ලදී.

එසේ හෙයින් ඉහත කී විත්තිකරුවන්ට හිමි පහත සඳහන් උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ වර්ෂ 2010ක් වූ ජුනි මස 18 වැනි දින පෙ. ව. 10.30 ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට ප්‍රසිද්ධ කරන ලදී. පසුව ඉහත කී 2010 ජුනි මස 18 වැනි දින ප්‍රසිද්ධ නිවාඩු දිනයක් ලෙස රජය විසින් ප්‍රකාශයට පත්කරන ලද හෙයින් අධිකරණය නියෝගයක් මගින් එකී වෙන්දේසිය නවත්වන ලදී.

එසේ හෙයින් තවදුරටත් විත්තිකරුවන් 2013.01.31 වැනි දින වනවිට පැමිණිලිකාර බැංකුවට රු. 21,173,660.07 ක මුදලක් ගෙවිය යුතුව ඇති හෙයින් පැමිණිලිකාර බැංකුව ඔවුන්ගේ 2012 අගෝස්තු මස 27 දිනැති ලිපිය මගින් මෙම දේපළ නැවත වතාවක් ප්‍රසිද්ධ වෙන්දේසිය සඳහා නියම කරන ලෙසට මට උපදෙස් ලබා දී ඇති බැවින් පහත උපලේඛනයේ විස්තර කරනු ලබන එකී දේපළ ම විසින් 2013 මාර්තු 18 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*ප්‍රවේශ මාර්ගය .-* මෙම දේපළ පිහිටා ඇත්තේ කොළඹ පිටකොටුව සිට පීපල්ස් පාක් සහ වේල්ල වීදිය පසුකර සී ස්ට්‍රීට් බෙදී යන වටරවුමෙන් දකුණට හැරී කලින් සෙන්ට්‍රල් රෝඩ් දැන් මොහමඩ් සේන් මාවත නමින් හඳුන්වනු ලබන ප්‍රධාන මාර්ගය දිගේ සඳහන් කළ වටරවුම පසුකර මීටර් 100ක් පමණ යනවිට දකුණු පසින් මෙම පාරට යාව වේ.

*ගෙවීමේ ක්‍රමය. -* වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් ගැණුම් මිලෙන් 25% ක මුදලක් එවේලේ ම වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු අතර ඉතිරි මුදල වන 75% දින 30ක් ඇතුළත ඉහත සඳහන් නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතු ය. ඒ සඳහා පිළිගත හැකි ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කරමින් විකුණුම් කොන්දේසි අත්සන් තැබිය යුතු ය.

තව ද, ගැණුම්කරු විසින් වෙන්දේසිකරුගේ කොමිස් මුදල වන ගැණුම් මිලෙන් 2 1/2% වෙන්දේසිය පැවැත්වීම සඳහා දරන ලද සියලුම වියදම්, තක්සේරු ගාස්තු 5% සහ පළාත් පාලන ආයතන ගාස්තු ගැණුම් මිලෙන් 1%ක් වෙන්දේසි අවසන් වූ අවස්ථාවේ ම වෙන්දේසිකරුට මුදලින් ගෙවිය යුතු ය.

### ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ ශාන්ත පෝල් කොට්ඨාසයේ දකුණු කොච්චිකඩේ පිහිටි වරිපනම් අංක පී 60, 60/17, 60/18 සහ 60/19 දරන බලයලත් මිනින්දෝරු වී. සිවසුන්දරම් විසින් සාදන ලද 1961.07.15 දිනැති අංක 1074 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන උතුරට : ප්‍රධාන පාර ද, නැගෙනහිරට : වේල්ල වීදියේ වරිපනම් අංක පී 69 ද, දකුණට : වේල්ල වීදිය වරිපනම් අංක 75 ද, බස්නාහිරට : ආදුරුප්පු විදිය වරිපනම් අංක 60/20 සිට 60/27 ද, මායිම් වූ පර්චස් නවයයි දශම නවයයි එකක් (අ. 0 රූ. 0 පර්. 9.91) ක ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද නිශ්චිත ඉඩම් කැබැල්ල සහ එහි තුළ පිහිටි සියලුම ගොඩනැගිලි වේ. මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 857/228 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. ඕ. පී. විජේසිංහ විසින් සම්පාදිත 1986.06.07 වැනි දින අංක 1988 දරන සැලැස්ම ප්‍රකාරව පහත සඳහන් ලෙස විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ මහ නගර සභාවේ කොට්ඨාස අංක 19 තුළ දකුණු කොච්චිකඩේ ශ්‍රීමත් රත්නජෝති සරවණමුත්තු මාවතේ (කලින් ආදුරුප්පු වීදිය) පිහිටි වරිපනම් අංක පී 60, 60/17, 60/18 සහ 60/19 දරන උතුරට : ප්‍රධාන පාර ද, මැද පාර ද, ශ්‍රීමත් රත්නජෝති සරවණමුත්තු මාවතේ

වරිපනම් අංක 60/16 ද, නැගෙනහිරට : අඩි පාර ද, දකුණට : වේල්ල වීදිය වරිපනම් අංක 75 ද, බස්නාහිරට : ශ්‍රීමත් රත්නජෝති සරවණමුත්තු මාවතේ වරිපනම් අංක 60/20 සිට 60/27 ද මායිම් වූ පර්චස් නවයයි දශම එකයි දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 9.1251) ක ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද නිශ්චිත ඉඩම් කැබැල්ල සහ එහි තුළ පිහිටි සියලුම ගොඩනැගිලි සමග වේ.

ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න,
බලයලත් වෙන්දේසිකරු/තක්සේරුකරු සහ
උසාවි කොමසාරිස්.

අංක 220/5, දිමුතු මාවත,
ගම්පහ පාර,
යක්කල.
දුරකථන අංක : 033-2222568 හෝ 071-8208360.

වැඩි විස්තර සඳහා.- සෙලාන් බැංකුව පීඑල්සී, සෙලින්කෝ සෙලාන් ටවර්ස්, අංක 90, ගාලු පාර, කොළඹ 03 (12 වැනි මහල) නීති අංශයෙන් විමසන්න.

02-578

---

## මහජන බැංකුව - ජාඇල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ඒකල ග්‍රාමයේ පිහිටි ගාල්ලවත්ත එස්ටේට්, නමැති ඉඩමේ නිවාසයක් සහිත පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල බිම් කොටස.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2013.03.05 වැනි දින පෙ. ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා *රජයේ ගැසට් පත්‍රයේ* 2010.07.09 වැනි දින ද, ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 2010.07.01 වැනි දින ද, පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - ජාඇල නගර මධ්‍යයේ සිට ඒකල දෙසට කිලෝමීටර් 1ක් පමණ ගමන් කළ විට දකුණට ඇති රජ මාවත හමු වේ. රජ මාවතේ කිලෝමීටර් 1.25ක් ගිය විට දකුණට දෙහියාගාත පාර හමු වේ. දෙහියාගාත පාරේ මීටර් 100ක් පමණ ගිය විට දකුණට ඇති මෙම රණසිංහ හෝමිස් නිවාස ව්‍යාපෘතියට යන පාරේ මීටර් 50ක් ගිය විට පාරේ දකුණු පස තෙවැනි ඉඩම් කොටස සහිත මෙම දේපළ හමු වේ.

*ගෙවීමේ ක්‍රමය .-* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්);
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක් ;
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද;
4. ලිපිකරුගේ සහ නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක් ;
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය කළමණාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ වෙත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර පහත ලිපිනයෙන් ලබාගත හැක. ප්‍රාදේශීය කළමනාකාර, මහජන බැංකුව, ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ.

දුරකථන අංක : 033-2222325, 033-2225008, 033-2231901,
ෆැක්ස් අංක : 033-2226165, 033-2226741.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු, සාම විනිසුරු
(මුළු දිවයිනටම).

*කාර්යාලය :* අංක 25 "බී", බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011-5756356, 2334808
නිවස : 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංක : 011 2419126, 071-8760986.

02-465

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 9/63582/ඉසඩ් 9/489.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.03.31 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2006.07.05 වැනි දින දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මාතර, කොටුව, ධම්මාරාම මාවත, අංක 14 හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2013.03.28 වැනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ මාතර කඩවත් සතර මාතර ප්‍රාදේශීය සභා සීමාවේ තල්පාවිල පිහිටි කළුවාගහහේන නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ෆෙඩි විජයවීර විසින් මැන සකසන ලද 1977.11.17 වැනි දින හා අංක 2133ඒ දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන් අක්. 0 රූඩ් 03 පර්. 12කින් යුත් කැබලි අංක 2 දරන බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමග වේ.

තව ද, එකී පිඹුරේ සඳහන් කැබලි අංක 2 බී (අඩි 10ක් පළල) සහ කැබලි අංක 2 ඒ දරන (අඩි 07ක් පළල) බිම් කොටස් මතින් දක්වා ඇති මාර්ග අයිතීන් ද සමග වේ.

මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක ඒ 366/205 යටතේ ලියාපදිංචි වී ඇත.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2013 ජනවාරි මස 31 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

02-523

---

### මහජන බැංකුව - ගාල්ල මහවීදිය ශාඛාව

### 1986 දරන අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2013.03.08 වැනි දින පෙ. ව. 10.30 ට මෙහි පහත විස්තර වන දේපළ එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

#### උකස්කර ඇති දේපොළ පිළිබඳ විස්තර

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල කඩවත් සතරේ මහ නගර සීමාව තුළ පෙට්ටිගල වත්ත පිහිටි වරිපනම් අංක 09 දරන විසෝම්තොට්ටම් නොහොත් විස්ටොම්තොට්ටම් හෙවත් ආර්මන්තොට්ටම් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. අඹවත්ත විසින් මැන සාදන ලද 2006.03.26 දිනැති අංක 1086 පිඹුර පරිදි ලොට් "ඒ" දරන පර්චස් තුනයි දශම තුනයි නවයයි තුනක් (අ. 0 රූ. 0 පර්. 3.393) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි, ගහකොළ පළතුරු ද වේ.

වැඩි විස්තර සඳහා 2009.10.02 දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2010.03.19 වැනි දින දිනමිණ, ඩේලිනිව්ස් හා තිනකරන් යන පුවත්පත්වල ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීමේ මාර්ගය.* - ගාල්ල නගරයේ සිට ඕල්කට් මාවත ඔස්සේ මීටර් 400ක් පමණ ඉදිරියට යන විට පෙට්ටිගලවත්ත 2 හරස් පාර හමුවේ. එම පාරේ ටික දුරක් ඉදිරියට යන විට පාරේ දකුණු පස වරිපනම් අංක 90 A දරන ස්ථානයේ පාරට මායිම්ව මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

01. ගැණුම් මිලෙන් 10%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ගාල්ල, පහළ ඩික්සන් පාරේ, අංක 22 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකාර මහතාට ගෙවිය යුතු ය.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

දුරකථන අංක : 091-2232311, 2234785, 2234171, 2223564,
ෆැක්ස් අංකය : 091-2232230

ජී. පී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුදුවත්ත,
වල්ගම, මාතර.
දුරකථන අංක : 041-2228731, 071-4438516.

02-591

---

### මහජන බැංකුව - මොරවක ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඩී" වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2013.03.12 වැනි දින පෙ. ව. 11.00 ට මෙහි පහත විස්තර වන දේපළ එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

#### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළයේ, වැලිව පිහිටි අමුණුදොලකුඹුර හෙවත් බඩල්ගෙ දොළමුනේ කුඹුර නමැති ඉඩමෙන් මාතර දිස්ත්‍රික් උසාවියේ අංක 12996 බෙදුම් නඩුව ප්‍රකාර 1943.05.28 දිනැති අංක 3171 පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ අංක "ඒ" අක්ෂරය දරන

කැබැල්ල 1988.03.05 වැනි දින බෙදා වෙන්කළ "ඒ 2 " දරන පිඹුර ප්‍රකාර පර්චස් විස්සක් (අක්. 0, රූඩ් 0, පර්. 20) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදිය ද වේ.

වැඩි විස්තර සඳහා 2012.04.20 දින රජයේ ගැසට් පත්‍රයේ ද 2012.06.26 වැනි දින "දිනමිණ", පුවත්පතේ ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - දෙනියාය, අකුරැස්ස මාර්ගයේ මොරවක, නෙළුව පාරට හැරෙන හන්දියේ සිට මීටර් 50ක් පමණ ගියවිට පාරේ දකුණු පසින් ප්‍රධාන පාරට මුහුණලා සුරැකුම් දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :-

01. ගැණුම් මිලෙන් 10%ක් ;
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිලෙන් 1%ක් ද ;
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් ගැණුම් මිලෙන් 2 1/2%ක් ද ;
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද ;
05. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද ;
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින තිහ (30) ක් ඇතුළත මාතර, නූපේ, අනගාරික ධර්මපාල මාවත, අංක 215 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ , ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතු ය.

දුරකථන අංක : 041-2222792, 2222822 හා 2224773
ෆැක්ස් අංකය : 041-2222688.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර,
දුරකථන අංක : 041-2228731, 071-4438516.

02-589

**ඩී එෆ් සී සී බැංකුව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වැනි වගන්තිය යටතේ විකිණීම

*විකුණුම 01*

**අංක 1392 සහ 1902 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, මැද පළාතේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාවට අයත්, ඉහළ කටුනේරිය පිහිටි, නැබොඩගහවත්ත ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු එම්. ජේ. ගෝමස් විසින් සාදන ලද, 1996 මැයි මස 28 වැනි දිනැති අංක 2140 දරන පිඹුරේ ලොට් අංක 6, 8 B සහ 13 ලෙස දැක්වෙන සහ බලයලත් මිනින්දෝරු එම්. ජේ ගෝමස් විසින් සාදන ලද 1996 මැයි මස 28 වැනි දිනැති අංක 2140 A දරන පිඹුරේ ලොට් අංක A ලෙස දැක්වෙන ඒකාබද්ධව පිහිටි බිම් කට්ටි හතර සහ එහි පිහිටි ගොඩනැගිලි සහ සියල්ල සහිතව.

*ඉඩමේ ප්‍රමාණය :* අක්. 01, රූඩ් 00, පර්. 4.8.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ දකුණු පිටිගල් කෝරළේ මැද පළාතේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාවට අයත්, ඉහළ කටුනේරිය පිහිටි, නැබොඩගහවත්ත ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු එම්. ජේ. ගෝමස් විසින් සාදන ලද, 1996 මැයි මස 28 වැනි දිනැති අංක 2140 දරන පිඹුරේ ලොට් අංක 5 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය සහ එහි පිහිටි ගොඩනැගිලි සහ සියල්ල සහිතව.

*ඉඩමේ ප්‍රමාණය :* අක්. 00, රූඩ් 02, පර්. 20.

*විකුණුම 02*

**අංක 1626 සහ 1902 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාවට අයත්, කොලින්ජාඩිය පිහිටි, තල්ගහවතු කැබැල්ල සහ දමින්නගහවතු කැබැල්ල ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු වයි. එම්. රංජිත් යාපා විසින් සාදන ලද 2004 අගෝස්තු මස 19 වැනි දිනැති අංක 9376 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය සහ එහි පිහිටි ගොඩනැගිලි සහ සියල්ල සහිතව.

*ඉඩමේ ප්‍රමාණය :* අක්. 01, රූඩ් 03, පර්. 10.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න විසින් සහතික කරන ලද, 2004 පෙබරවාරි මස 20 වැනි දිනැති අංක 1392 දරන 2005 ජූලි මස 01 වැනි දිනැති අංක 1626 දරන සහ 2007 පෙබරවාරි මස 23 වැනි දිනැති අංක 1902 දරන උකස්කරයන් ප්‍රකාර, අංක 297, බටහිර කොලින්ජාඩිය, වෙන්නප්පුව යන ස්ථානයේ සරනි ඇක්වේරියම් නම් තනි පුද්ගල ව්‍යාපාරය පවත්වාගෙන යන, වර්ණකුලසූරිය චන්දිම ප්‍රසාද් රාජිත ප්‍රනාන්දු විසින් ඩී එෆ් සී සී බැංකුවට උකස්කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2013 මාර්තු මස 06 වැනි දින (බදාදා) පෙ. ව. 11.00 ට සහ ප. ව. 12.30 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. (පිළිවෙලින්)

*ගෙවීමේ ක්‍රමය.-* මිල තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු යː-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැනුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාර) ;
4. එක් එක් මිල දී ගැනීමක් සඳහා රු. 41,000 ක් වන ප්‍රචාරක පිරිවැය ;
5. එක් එක් මිල දී ගැනීමක් සඳහා ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500 ;
6. එක් එක් මිල දී ගැනීමට අදාළ විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් (සියයට අනූවක්) වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011- 2442442.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ /අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි."

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 121 ක සේවා විශිෂ්ටත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය ඃ*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය ඃ 081-2227593,
දුරකථන/ෆැක්ස් අංකය ඃ 081-2224371,
ඊ මේල් ඃschokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය ඃ*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන අංක ඃ011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංක ඃ011-2588176,
ඊ මේල් ඃschokman@samera1892.com.

වෙබ් අඩවිය ඃwww.sandslanka.com

02-514

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.